ඇමරිකානු තානාපතිනිය පාසල් ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක් විවෘත කරයි

අප්‍රේල් 19, අඩ්ඩාලච්චනෙ සහ කල්මුනේ : සිසුන් 1300 කට පමණ ඉගෙනුම ලැබිය හැකි, අලුතින් පිළිසකර කරන ලද පාසල් දෙකක් ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද තානාපතිනිය, අලෙනා බී. ටෙප්ලිට්ස් විසින් ඊයේ විවෘත කරන ලදී. පිළිසකර කිරීම් වලින් අනතුරුව, පාසල් දෙකෙහිම සිසුන් 850 කට පමණ නව ඉගෙනුම් වරම් හිමි විය. ඇමරිකානු රජය විසින් රුපියල් මිලියන 1700 කට (ඇ. ඩොලර් 940,000) අධික වියදමකින් පිළිසකර කරන ලද අන්-නූර් සහ කාරියප්පර් යන පාසල් දෙක, ඇමරිකානු ඉන්දු-පැසිෆික් බලකායේ සම්බන්ධීකරණය කිරීම තුළින් සිදු විය.

මෙම අවස්ථාවට සහභාගී වූ අමුත්තන් අතර නැගෙනහිර පළාත් ආණ්ඩුකාර එම්. එල්. ඒ. එම් හිස්බුල්ලා, පාර්ලිමේන්තු මන්ත්‍රී ඒ. එල්. එම්. නසීර් සහ ත්‍රිකුණාමල ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයේ පෙර පාසල් කළමනාකරණ කමිටුවේ සභාපති, එම්. එස්. උතුමාලෙබ්බේ ද විය.

"මෙම පාසල් පිළිසකර කිරීමේ ව්‍යාපෘතීන් ගම්බද සහ අඩු පහසුකම් සහිත ප්‍රජාවන් සඳහා කෙලින්ම වාසිදායක වෙයි. මෙමඟින් රැකියා අවස්ථා බිහිවන අතර එක් එක් ප්‍රජාවන් වල පාසල් පරිපාලකයින් ප්‍රමුඛ හවුල්කරුවන් ලෙස හඳුනාගෙන විවිධ ව්‍යාපෘතීන් වල නිරත වීමේ හැකියාව ලැබේ," යයි ටෙප්ලිට්ස් තානාපතිතුමිය ප්‍රකාශ කළ අතර තවද පැවසුයේ, මෙම පාසල් ව්‍යාපෘතීන් තුළින් පිළිබිඹු වන්නේ ඇමරිකානු වැසියන් තුළ, ලාංකික දරුවන් හට සුරක්ෂිත හා සුහද ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමට ඇති කැපවීම බවයි.

කාරියප්පර් පාසල තුළ සිදුකරන ලද ඉදිකිරීම් අතර අබාධ සහිත පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි, පන්ති 12-කින් සමන්විත ගොඩනැගිල්ලක් ද වෙයි. අන්-නූර් පාසලේ සිදුකරන ලද නව පන්ති 10 හි ඉදිකිරීම් වලට අමතරව, නව පන්තිකාමර සඳහා අලුත් පුටු සහ මේස ද හිමි විය. සිදුකරන ලද තව නව ඉදිකිරීම් අතරට, අලුත් දොර ජනෙල්, ආරක්ෂා සහිත ජනෙල් ග්‍රිල් සවි කිරීම්, විදුලි උපාංග අලුත්වැඩියාව, බිත්ති සහ බිම් අලුත්වැඩියාව සහ නව අකුණු සන්නායකයක් සවි කිරීම ද විය.

ඊට අමතරව නව වැසි ජල රැස් කිරීමේ පද්ධති, අබාධිත පුද්ගලයින්ට ප්‍රවේශ විය හැකි වැසිකිළි සහ හදිසි ආපදා තත්වයකදී අවතැන් වුවන් සඳහා ආහාර පිසිය හැකි ශාලාවක් ද නව ඉදිකිරීම් අතර වෙයි. මෙම වර්ෂය තුළ ඇමරිකානු ඉන්දු-පැසිෆික් බලකාය විසින් මීට පෙර මෙවන් පාසල් ඉදිකිරීම් ව්‍යාපෘති දෙකක් අවසන් කරන ලද අතර, තවත් නව ව්‍යාපෘතීන් තුනක ඉදිකිරීම් මෙම වසර තුළ අවසන් කිරීමට නියමිතය.